# ‘පට්ඨාන’ එකළොස්වැනි දේශනාව

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන්වහන්සේ අනන්ත දුක් ඇති සංසාර කාන්තාරයට බැස සත්වයන් කෙරෙහි පතල මහා කරුණාවෙන් දානාදී දස පාරමී ධර්මයන් සර්වප්‍රකාරයෙන්ම සම්පූර්ණ කර ගත්ත. උන්වහන්සේට කල් ඇතුවම නිර්වාණ ධාතුව ප්‍රත්‍යක්ෂ කරගෙන අවබෝධ කරගෙන නිවනින් සැනසෙන්ට තිබ්බිච ඒ ධර්ම ප්‍රතිලාභය නිර්වාණ ප්‍රතිලාභය අනිත් සත්වයක් කෙරෙහි පතල කරුණාවෙන් ප්‍රතික්ෂේප කරලා සාර අසංඛ්‍ය කල්පලක්ෂයක් මහා කරුණාවෙන් මහා දයාවකින් උන්වහන්සේ පාරමී පුරාගත්තා. ඒ පාරමී පිරුවාවූ පාරමීභූමියට පාරමී භූමියෙන් ලද පාරමී ධර්මයන්ගෙන් ශක්ති සම්පන්න උනාවූ සන්තානයක් ඇති බුදුරජාණන්වහන්සේට පාරමී ධර්ම බලයෙන්ම සර්වඥතා ඥාන ප්‍රතිලාභය සිද්ධ කරගත්තාවූ ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන් වහන්සේට සත්වයන්ගේ චුති උප්පත්තිය දකින්නාවූ දිවැස් පහළ කර ගත්තාවූ ශාන්තිනායක ධර්මරාජයාණන් වහන්සේට හේතු ඵල ධර්මයන්ගේ තිබෙන්නාවූ නියම තත්වය දකින දහම් ඇස පහළ කර ගත්තාවූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට සත්වයන්ගේ මනස ධර්මඥානය අඩු වැඩි භාවය දකින්නාවූ බුදු ඇසක් ඇති ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන් වහන්සේට පාරමී ධර්මයන්ගේ ආනුභාව බලයෙන්ම පස්පැය දිස්නා නේත්‍රා යුගලයක් කායික වශයෙන් ලැබුවාවූ ශාන්තිනායක ධර්මරාජයාණන් වහන්සේට සියලුම ධර්මයන් දකින්නාවූ සර්වඥතාඥානයෙන් පරිපූර්ණ සන්තානයක් ඇති බුදුරජාණන්වහසේට අනන්ත අපරිමාණ බුද්ධ ගුණයන්ගෙන් අනන්ත අපරිමාණ වූ බුද්ධ ඥානයන්ගෙන් සීල සම්පත්තියෙන් සමාධී සම්පත්තියෙන් ප්‍රඥා සම්පත්තියෙන් උත්තරීතර භාවයට පත්වුනාවූ ශාන්තිනායක ධර්ම රාජයාණන් වහන්සේට මම මේ වෙලාවේ සිරසින් වැඳ නමස්කාරය කරනවා මගේ නමස්කාරය වේවා!

සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සන්තානයෙන් දැක අවබෝධකොට ගත්තාවූ ඒ උතුම් වූ ශ්‍රී සද්ධර්මස්කන්ධයට මම සිරසින් වැඳ නමස්කාරය කරනවා මගේ නමස්කාරය වේවා!

ඒවාගේම සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ඒ උතුම් වූ ධර්මය තමන්ගේ හිතට අරගෙන ධර්මයට ජීවිතය කැප කොට පරම ශාන්ත වූ නිර්වාණ ධාතුව අවබෝධ කරගනිමින් ධර්මයට අනුයාතව කටයුතු කොට ආහුණෙයයා ආදී ගුණයන්ගෙන් පරිපූර්ණ සමලංකෘත උතුම් ජීවිත දරන්නාවූ ශ්‍රාවක මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා. මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයට ධම්ම රත්නයට සංඝ රත්නයට කෙටියෙන් හෝ වේවා ගුණ සිහිපත්කොට වන්දනා කිරීමෙන් පහළ වෙන ඒ සිත්විලි වල තිබෙන්නාවූ කුසල ජවන් සිත්වල පහළ වන්නාවූ කුසල බලයෙන් ඒ උතුම් වූ පුණ්‍ය ශක්තියේ බලයෙන් බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයේ අනන්ත අපරිමාණ ගුණ අනුභාව බලයෙන් මේ පිංවත් අසාගෙන සිටින සියලු දෙනාම මීට පෙරාතුව සිදු කරගෙන තිබෙන්නාවූ දාන සීල භාවනා ආදී සියලුම පුණ්‍ය ධර්මයන්ගේ කුසල ධර්මයන්ගේ ආනුභාව බලයෙන් අද ලොව්තුරා බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට විස්තර කරල තිබෙන්නාවූ ඒ ධර්මයේ කොටසක් අපි සාකච්ඡා කිරීම් වශයෙන් ඉදිරියට ගෙන යනවා. ඒ ඒ ඉදිරිපත්වන ධර්ම කරුණු අද මේ ශ්‍රවණය කරගෙන සිටින්නාවූ පිංවත් සැම දෙනාටම ඒකාන්තයෙන්ම වැටහේවා අවබෝධ වේවා! නිරවුල්ව තේරුම් ගන්ට ලැබේවා! ඒ තේරුම් ගැනීම් තුල පඥා චෛතසික දියුණු වේවා! ප්‍රඥා ධර්මය වැඩේවා! ඒ පඥා ධර්මයට උපකාරක ධර්ම හැටියට සමාධි ගුණය නිකලෙස්ව පිහිටාවා! පහළ වේවා! එයට අවශ්‍ය කරන්නාවූ සති ගුණය මනසිකාර ධර්මය ඒවාගේම බුදුරජාණන් වහන්සේ කෙරෙහි පවතින ශ්‍රද්ධාව බුදුරජාණන්වහන්සේගේ ධර්මය කෙරෙහි පවතින ශ්‍රද්ධාව වැඩේවා! සැම දෙනාටම හොඳින් පංච නීවරණ ධර්මයන්ගෙන් පීඩාවට පත්නොවිච්ච හිතකින් ශ්‍රද්ධාවන්ත හිතකින් මේ ධර්ම කරුණු ටික අවස්ථාවට අනුකූලව ඉදිරිපත් කරගෙන සාකච්ඡා කොටගෙන සැම දෙනාටම ධර්මඥානය පහළ කරගෙන හේතු ඵල ධර්ම සංඛ්‍යාතව කථා කරන සිත පිළිබඳව අවබෝධ කරගෙන චෛතසික ධර්ම පිළිබඳව අවබෝධ කරගෙන රූප ධර්මයන්ගේ තිබෙන්නාවූ නියම සවභාවය අවබෝධ කරගෙන ඔය ස්ථාන තුනටම ඇලෙන්නේ නැතුව බැඳෙන්නෙ නැතුව පතන්නේ නැතුව ඒ හිතින් අයින්වෙලා චෛතසික ධර්මයන්ගෙන් අයින් වෙලා රූප ධර්මයන්ගෙන් මිදිලා සැමදෙනාටම පරම ශාන්ත වූ පරම සූක්ෂම වූ පිරිසිදු වූ ධර්මස්වභාවයක් වන ඒ උතුම් නිර්වාණ ධාතුව නිර්වාණ ධර්මය සුවසේ අවබෝධ කරගන්ට ලැබේවා! නිවන් අවබෝධ කරගැනීම පිණිස තමන් කරන්නාවූ ධර්ම මනසිකාරයක් බවට මේ වැඩ සටහන පත්වේවා කියල අපි මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා

කරනවා. එසේ ප්‍රර්ථනා කරමින් තමයි අපි අද මේ පින්වතුන්ට අවස්ථානුකූලව මේ කරුණු ටිකක් ඉදිරිපත් කරන්ට බලාපොරොත්තු වන්නේ.

ගිය අවස්ථාවේදී අපි මතක් කළා අපේ පින්වතුන්ට අලුත් මාතෘකාවක්. ඒ තමයි ප්‍රත්‍යය ධර්ම 24 තුන්වෙනි ප්‍රත්‍යය ධර්මය කියල දුන්නා. ඒ තමයි 'අධිපති' ප්‍රත්‍යය. අධිපති ප්‍රත්‍යයයෙන් කියල දුන්නේ - මේ පින්වතුන් සාකච්ඡා කරන්ටත් ඇති - අධිපති ප්‍රත්‍යය කියල කිව්වේ උපකාරක ධර්මය. යම්කිසි දෙයක් - යම්කිසි ධර්මස්වභාවයක් - පොකුරු ධර්මයක් සිද්ධ වීමේදී - චිත්ත ධර්ම - චෛතසික ධර්මයන්හි - සමහර ධර්ම තිබෙනවා මහා පුළුල් - ඒ වාගේම ප්‍රබල ශක්තියක් තිබෙන දේවල්. ආන්න ඒ වාගේ ධර්ම 4 ක් තිබෙනවා, ඡන්ද - චිත්ත - විරිය - විමංසා කියල. ඒ ධර්මතා හතර අනිත් ධර්මයන්ට බලපාන විදිය තමයි අපි මතක් කලේ. ඒකට කිව්වා මොකක්ද 'සහජාත ධර්ම අධිපතිත්වය' කියල. ඊට කලින් අපි කිව්වේ 'ආරම්මණ ප්‍රත්‍යය'. දැන් තුන්වෙනි ප්‍රත්‍යය කිව්වා. ඊළඟට ප්‍රශ්නත් අවස්ථානුකූලව කීප දෙනෙක් ගොඩනැගුවා.

අද මම කැමතියි මේ පින්වතුන්ට මතක් කරන්ට අලුත් ධර්ම කොටසක්. ඒ තමයි හතරවෙනි ප්‍රත්‍යය ධර්මය. 4 වෙනි ප්‍රත්‍යය ධර්මය ගැන කථා කරන කොට මේ විදියට තියෙනවා. පට්ඨාන ධර්ම විග්‍රහයේ **'චක්ඛුවිඤ්ඤාණධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො. මනොධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනොවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො'** කියල පට්ඨාන දේශනාවේ හතර වෙනි ප්‍රත්‍යය ධර්මය පිළිබඳ කියවෙනවා.

අපි මෙතන තිබෙන වචනය තේරුම් ගැනීම ඉතාමත්ම වැදගත් වෙනවා. අපේ මේ ලෝකය වටේ නොයෙක් රටවල් වල ඉඳගෙන මේ දහම් වැඩ සටහනට එක්කාසු වෙලා කන් යොමාගෙන ඉන්න පින්වතුන්ට - නවක පින්වතුන්ට - ආදුනික අයට - ධර්ම ගැන හිතන සහ මේ වැඩ සටහනට දීර්ඝ කාලීනව සහසම්බන්ධ වෙලා කටයුතු කරන මේ පින්වතුන් සැම දෙනා කෙරෙහිම ටික වේලාවකට නමුත් කරුණාව උපදවල එක වචනයක් හරි නිවැරදිව කියල දෙන්ට අපි හරියට ඉදිරිපත් වෙනවා. මහන්සි ගන්නවා. මේ වචනය හොඳට තේරුම් ගන්ට. එතකොට මේක මේ පින්වතුන්ට පිහිට වෙයි.

බලන්ට මේකේ තිබෙනවා 'අනන්තර ප්‍රත්‍යය' = 'අනන්තරපච්චය' කියල. අනන්තරපච්චය කියල කියන්නේ - හොඳට හිතල බලන්ට - අනන්තර කියල

කියනකොට මොකක්ද හැඟෙන්නේ කියල. 'අන්තර' කියල කියන කොට 'අතරක්' කියන එකයි. 'අතර' කියන එක තමයි 'අන්තර' කියල පාලි භාෂාවෙන් පාවිච්චි කරන්නේ. 'අන්තර = අතර' කියල කියන කොට අපිට හොඳට තේරෙන්න ඕනෑ යම් කිසි කාරණා දෙකක් හරි - තුනක් හරි - හතරක් හරි - පහ හයක් හරි මැද්දැවෙ කියල. ඒක කොහොමද කියනවනම් - යම් කිසි විනාඩි තුනක් තිබුනොත් පළවෙනි විනාඩි යයි තුන්වෙනි විනාඩියයි අතරට යොදන්න පුළුවන් දෙවෙනි විනාඩිය. ඔය කරුණු දෙකක් අතරට.

අපි හිතමු තවත් ධර්මතා තුනක් තියෙනවා. කවදාවකත්ම මනුස්සයකුට භාජනයක් තියන්න බෑ ලිපක ලිප්ගල් තුනක් නැතුව. එතකොට ගල් තුනක් තියෙන්න ඕන. ගල් දෙකක් තියල ඒ ගල් දෙකක් උඩ වතුර භාජනයක් තියල උණුකරන්න බෑ. ගල් තුනක් තියෙන්ට ඕන. ලිප්ගල් තුනක් තියෙනකොට ලිප්ගල් තුනක අන්තරය - space එක රඳා පවතින්ට එය පාවිච්චි කරනවා. සමහර වෙලාවට හතරක් වෙන්ට පුළුවන්. එතකොට බලන්න මේ අන්තරය කියන වචනය - ධර්මතා දෙකක් අතරට හරි එහෙම නැත්නම් ධර්මතා තුනක් අතරට හරි ධර්මතා හතරක් - පහක් - හයක් හරි අතරකට තියෙන්නාවූ ඒවාට කියනවා 'අන්තරය' කියල. විශේෂයෙන්ම මෙතන කථා කරනවා අඩුම වශයෙන් ගත්තට පස්සේ ධර්මතා දෙහෙකට අතර. 'අතර' කියන වචනේ ඇහෙන කොට ඔය විදියටනේ අපිට හැඟෙන්නේ. එතකොට ඔය 'අතර' කියන වචනය ඔය විදියට කියනවා.

දැන් මෙතන තියෙන්නේ 'අතර' කියනඑක නෙමෙයි. මේකේ තියෙන්නේ 'අන්' + 'අන්තර' = 'අන්තර'. 'අන්තර' කියන වචනයට මුලින් 'අන්' කියන උපසර්ගය යොදාගෙන තියෙන්නේ 'නෑ' කියන්න. 'නිශේධ' අර්ථයෙන්. 'අන්' 'අන්තර' කියන එක තමයි 'අනන්තර' කියල කියන්නේ. ඒ කියන්නේ අතරක් නෑ. එතකොට අතරක් නැතිව යම්කිසි දෙයක් සිද්ධ වෙනවා. අතරක් නැතුව දෙයක් සිද්ධ වෙනවා. 'සිද්ධ වෙන දේ අතරක් නැතුව සිද්ධ වෙනවා' කියන ඒ 'ප්‍රත්‍යය ධර්මය' විස්තර කරන්ට තමයි - එහෙම දෙයක් සිද්ධ වෙන නිසා තමයි - මේක විස්තර කරන්නේ. ඒක තමයි මේ 'අනන්තර ප්‍රත්‍යය' ධර්මයන්ගෙන් කියන්නේ.

යම්කිසි පුගලයකුගේ සන්තානයේ පහළ වෙනවා දිගින් දිගටම සිත්. ඉතින් මේ සිත් දිගට පහළ වෙනවා - එකකට පස්සේ එකක් - එක සිතකට පස්සේ එකක් - ඔය විදියට දිගට - දිගට - දිගට සිත් පහළ වෙනවා. දැන් මේ සිත් පහළ වෙනකොට පස්සේ පස්සේ පහළ වෙනසිත් පහළ වෙන්නේ ඉස්සරවෙලා

ඉස්සරවෙලා ඉස්සරවෙලා පහළ වෙන සිත් නිසයි. දැන් බලන්නකෝ ඔය වැලක් එහෙම නැත්නම් දළුවක් දානවා කියල ගහක. ගහක කොළ හැදෙන කොට අග්ගිස්සෙන් අග්ගිස්සෙන් මේ කොළ ඉස්සරහට ඉස්සරහට තල්ලුවෙලා තල්ලුවෙලා එනවා. ඉතින් පොඩ්ඩ පොඩ්ඩ ගහ ඇතුලෙන් ඉස්සරහට තෙරපිලා තෙරපිලා මේක දළු දාල - දළු දාල ඉස්සරහට එනවා. ඒ අග්ගිස්සෙම තිබෙන්නාවූ පුංචි දල්ලක් එන්න හේතු වෙනවා ඊට ඉස්සරවෙලා හැදිලා තිබෙන්නා වූ දළු - කොළ - අතු - හැම එකක්ම උපකාර වෙනවා. ඒවගේ ඉස්සෙල්ල ඉස්සෙල්ල පහළ වෙච්ච සිතක් නිසා තමයි පස්සේ පස්සේ සිත් පහළ වෙන්නේ. ඒක නිසා ඒ සිත් පහළ වෙන පරම්පරාව කැඩෙන්ට නොදී එතන කිසිම break එකක් වෙන්නෙ නැතුව - නවතින්නේ නැතුව දිගට පහළ වෙනවා. එතකොට පස්සේ හිටපු ගමන්ම සිතක් පහළවෙනවා නෙමෙයි. පස්සේ සිත් පහළ වෙනකොට ඒ පහළ වෙන සිතට අනිවාර්යෙන්ම ඉස්සර වෙලා පහළ වෙච්ච සිත් උපකාර වෙනවා. පස්සේ සිත් පහළ වෙන්නේ ඉස්සෙල්ලා සිත් පහළ වෙච්ච නිසා. ආන්න ඒ සිත් පහළ වෙනකොට අතරක් නැතුව - ඒ සිත් නිකං තව හිතක් පහළ වෙන්නේ නැතුව break එකක් තියන්ට - rest එකක් තියන්ට - gap එකක් තියන්ට - මේ මොකක්වත් තියන්නේ නැතුව හැම හිතකටම පස්සෙම ගැලපෙන සිතක් - හොඳට ගැලපෙන හිතක් පහළ කරන්ට හේතුවන ගතියට කියනවා මොකක්ද? **'අතරක් නැතුව සිත් පහළ වෙන්ට උදව් වෙන උපකාරවෙන ධර්මස්වභාවය කියල'**. ඒ ධර්මස්වභාවය හරි පුදුම දෙයක්. වෙන කිසිම ධර්මයකට - නැවතීමකට - එන්ට නොදී හරියට ගැලපෙන්ට ඒක සිද්ධ වෙනවා. මේ අනන්තර ප්‍රත්‍යය ගැන කථාකරන කොට අමුතු වචන භාවිතයක් තිබෙනවා. ඒ වචන භාවිතය හරී හොඳින් අපි දැන ගන්න එක හොඳයි.

ඒවගේම තවත් මට හිතිච්ච එකක් තමයි - මේකත් මේ පස්සට කල් දැම්මොත් එහෙම අමතක වෙලා යාවි. ඒ නිසා මේ බණ කියන වෙලාවේම අනන්තර ප්‍රත්‍යය ගැන කථා කරගෙන යනකොට මම මේක මතක් කරන්නේ.

බලන්ට අපේ සමාජයේ තියෙනවා 'බුද්ධ පූජා'. බුද්ධ පූජාව තියෙනවා බුදුරජාණන් වහන්සේ වෙනුවෙන්. ඊළඟට 'බෝධි පූජා' තියෙනවා බෝධීන් වහන්සේ වෙනුවෙන් බුදුරජාණන්වහන්සේගේ ඥානය සිහිපත් කරලා. ඊළඟට තියෙනවා චෛත්‍යය පූජා. චෛත්‍යය රාජයාණන්වහන්සේට ශාරීරික ධාතුන් වහන්සේලා වෙනුවෙන්. ඊළඟට තියෙනවා ධාතු පූජා. සර්වඥධාතුන් වහන්සේට පූජාවක් වශයෙන්. දළදා පූජාව තියෙනවා. එතකොට බුද්ධ පූජාව - ධර්ම පූජාවත් ඕකටම අයිතියි. ධර්ම පූජා කියල පවත්වන්නේ නම් සාමාන්‍යයෙන් ඔය ධර්ම

දේශනා  කරන සවාමීන්වහන්සේ කෙනෙකුට උපකාරයක් කරන එක. සංඝ පූජා කියලත් තියෙනවා. එතකොට සාංඝික දාන වශයෙන් ගන්න පුළුවන්. විශේෂයෙන්ම ප්‍රකටව තියෙන්නේ බෝධි පූජා - බුද්ධ පූජා - ඊට පස්සේ ධාතු පූජා - චෛත්‍යය පූජා ඊළඟට තියෙනවා බුදුරජාණන්වහන්සේගේ ඥානයන්ට කරන පූජා - දස තථාගත බල ඥාන පූජා - ඊළඟට තියෙනවා චුද්දස මහා ඥාන සිහිපත් කරලා ඒ විදියට පූජා පවත්වනවා.  සත්තිස් බෝධිපාක්ෂික ධර්ම පූජා තියෙනවා. තෙසැත්තා ඥාන පූජා තිබෙනවා. මේ ඥාන මේ කාටද? ලොව්තුරා බුදුරජාණන්වහන්සේට. බුදුරජාණන්වහන්සේගේ දස බල ඥාන සිහිපත්කරගෙන දස බල ඥාන පූජාවක් කරනවා. තෙසැත්තා ඥාන සිහිපත් කරගෙන තෙසැත්තා ඥාන පූජාවක් කරනවා. ඊළඟට සත්තිස් බෝධිපාක්ෂික ධර්ම මුල් කරගෙන බෝධිපාක්ෂික ධර්ම පූජාවක් පවත්වනවා. ඔය විදියට කරගෙන යනකොට තව එකක් මතක් වෙනවා. අපි මේ කථා කරන්නේ බුදුරජාණන් වහන්සේගේ මහා ගාම්භීර නුවණින් ස්පර්ශ කරපු හරි සියුම්ව - හරි සූක්ෂමව මැදී ගියා වූ - බුදුරජාණන් වහන්සේගේ හිතේ ඥානයෙන් ස්පර්ශ වෙලා ඇතිල්ලී ගොස් ඉතාමත් සුවිසුද්ධව අවබෝධකරගත්ත ධර්ම සමූහයක් මේ අපේ පුංචිම පුංචි ඥානයකින් එහෙම නැත්නම් පුංචි දැනුමකින් තමයි මේ කියල දෙන්නේ. අපි මේ න්‍යාය  - මේ ක්‍රමය බුදුරජාණන් වහන්සේ දේශනා නොකරන්ට - මේ ක්‍රමය උන්වහන්සේ  පෙන්නා නොදෙන්ට - මේ ක්‍රමය උන්වහන්සේගේ ශ්‍රාවක සැරියුත් මහා රහතන් වහන්සේ විග්‍රහ නොකරන්ට අපි අසරණයි. අපිට මේක කථාකරන්ට බෑ. ඒනිසා අපි බුදුරජාණන් වහන්සේටත් - උන්වහන්සේගේ සර්වඥතා ඥානයටත් - උන්වහන්සේගේ සන්තානයේ පහළ වෙච්ච මේ මහා ගාම්භීර පට්ඨාන ධර්මය දැනගත්ත - පට්ඨාන ධර්ම - පච්චය ධර්ම හොඳට දැන ගත්ත - අවබෝධ කරගත්ත ඒ ඥානයට -  ඒ ඥාන කාණ්ඩ ඔක්කොම එකතු කරලා ධර්ම ටික මුල් කරගෙන පට්ඨාන  ධර්ම පූජාවක් කරමු. කොච්චර වටිනවද? කොච්චර උතුම්ද? කොච්චර  ශ්‍රේෂ්ඨද? තෙසැත්තා ඥාන පූජාවක් කරන්න පුළුවන් නම් - දස බල ඥාන පූජාවක් කරන්න පුළුවන් නම් - සත් තිස් බෝධිපාක්ෂික ඥාන ධර්ම පූජාවක් කරන්න පුළුවන් නම්. මේකත් ඒවගේමයි - ඒ බුදුරජාණන් වහන්සේට ඉතාමත්ම උතුම් වන්දනාවක් උතුම් පූජාවක් ශ්‍රේෂ්ඨ පූජාවක්. ඒ පූජාව ඒ වන්දනාව ඔස්ට්‍රේලියා භූමියේ හරි ඒවගේම Melbourne හරි  Canberra හරි Sydney හරි නවසීලන්තයේ හරි  ශ්‍රී ලංකාවේ හරි ප්‍රංශයේ හරි කොහේ හරි කරනවානම් හරි වටිනවා. එතකොට අපි දැන ගත්ත මේ  ධර්මය - මෙච්චර අහන - මෙච්චර හිතන - මෙච්චර කථාකරන මේ ධර්මය තව තව අපේ හිත්වලට වැඩිපුර

වැක්කෙරෙන්ට ඒක මාර්ගයක් වෙනවා. ඒක උතුම් දෙයක් වෙනවා. ඒක මම කියන්නේ එක්තරා ධර්මයක් හින්දයි. අමතක කරන්න එපා අද කථා කරන ධර්මය. අද මේ කථා කරන්නේ 'අනන්තර ප්‍රත්‍යය' ගැන. 'අනන්තර ප්‍රත්‍යය' ගැන කථා කරනකොට වටපිටාව පිළිබඳව ඩිංගක් සපර්ෂ කරන්න ඕන.

බුදුරජාණන්වහන්සේට යම්කිසි ගෞරවයක් තිබුනාද ඒ ගෞරවයේ විදියට තමයි අපේ හිතේ ධර්මය පිහිටන්නේ - අහන්න පුළුවන් කම තියෙන්නේ සහ රැඳෙන්නේ. බුදුරජාණන්වහන්සේට - උන්වහන්සේගේ ධර්මය පවත්වාගෙන ආපු ඒ ආර්ය සංඝ රත්නයට - ඒ ස්වාමීන් වහන්සේලාට ගෞරවයක් නැතුව - ශ්‍රද්ධාවක් නැතුව - ප්‍රසාදයක් නැතුව ඒවගේම (රන්ධ ගවෙසී ) අඩුපාඩු බලන හිතකින් - වැරදි හොයන හිතකින් - ගෞරව නැති හිතකින් කොච්චර බණ ඇහුවත් - කොච්චර loud speakers දාල බණ ඇහුවත් කවදාක්වත් ඒ බණ ඒ ධර්මය හිතේ හිටින්නේ නෑ රැඳෙන්නෙ නෑ. ඒකාන්තයෙන්ම එයා ධර්මයෙන් out වෙනවා. මම දැකල තියෙනවා ඒක. හරියට දැකල තියෙනවා ඒක. මේ අහිංසක මිනුස්සු ඇවිල්ල සල්ලි මිල මුදල් වලින් යම් යම් අඩුපාඩුකම් තිබුනත් බාහිර වස්තුවලින් අඩුපාඩුකම් තිබුනත් - මේ ධර්මයට බුදුරජාණන්වහන්සේට පුදුම විදියේ කැප වීමක් භක්තියක් තිබෙනවා. නියම ධර්ම ගතියක් ශ්‍රද්ධාව වශයෙන් පිහිටනවා. ඒ අයගේ ධර්ම දැනුමත් ඒ විදියමයි. බැලුවයින් පස්සේ ඇයි එහෙම වෙන්නේ කියල - සමහර අය ඉන්නවා පොත් පත් තියෙනවා ගොඩ - වස්තුව තිබෙනවා නමුත් ධර්මඥානය වශයෙන් ගත්තට පස්සේ හරීම බාලයි. හරීම හීනයි. හරිම දුප්පත්. ඒවාගේම ඇයි ඒකට හේතුව? ධර්ම ගෞරවය නෑ. ඒකයි හේතුව. ධර්ම ගෞරවය - ශ්‍රද්ධාව නෑ.

මම මේ බටහිර ජීවත්වෙන භික්ෂූන් වහන්සේ නමක් හැටියට දකිනවා මෙන්න මෙහෙම දෙයක්. මෙහෙ පාසල් වල ගුරුවරු ආසියාතික ළමයින්ට උගනන්ට කැමතියි. ඉන්දියාව - ශ්‍රී ලංකාව - මලේෂියාව - ඒ අයට උගන්වන්න කැමතියි. මෙහෙ ඉන්න අයට උගන්නන්ට වැඩි කැමැත්තක් නෑ. හැබැයි රස්සාව හැටියට කරනවා. වැඩි කැමැත්තක් නෑ. මම එහෙම කියපු ගුරුවරු කීප දෙනෙකුගෙන්ම ඇහුවා. සුදු අයගෙනුත් ඇහුව. ඒ අය කිව්වේ මෙහෙ ඉන්න ළමයින්ට උගන්නන්ට හරි අමාරුයි, ඒ කියන්නේ බටහිර ඉපදිච්ච අයට. බටහිර ජාතිකයන්ට. ආසියාතික ළමයි හරියට ඇහුම්කන් දෙනවා. ගුරුවරයාට හරියට ගරු කරනවා. ගුරුවරයාට හරියට කීකරුයි. ගුරුවරයා කෙරෙහි හරි ගෞරවයක්

භක්තියක් ප්‍රසාධයක් තිබෙනවා. ගුරුවරයාට කවදාවත් නින්දා කරන්නේ නෑ. එකට එක කියන්නේ නෑ. බලන්නකෝ ඒ වැඩේ ඇයි ඒ කියල. ඒ ධර්මය නිසාම ඒ ළමයින්ට හොඳට උගන්නන්න පුළුවන්. ඉගෙන ගන්න දේට හොඳට marks ලැබෙනවා. අනිත් අය මොකද කරන්නේ - ගොඩක් අකීකරු ගතියත් තිබෙනවා - ඒ වාගේම තමයි අහන්නේ නෑ - ඊළඟට aginst යනවා ගුරුවරයාට - විරුද්ධව යනවා - ආන්න ඒ වගේ ළමයින්ට ඉගෙන ගන්ට බෑ. මේක ඇත්ත වශයෙන්ම ඔය ඉස්කෝල ඇවිල්ල ධර්මය උගන්නන තැන් නෙමෙයිනේ. සමාජයේ තියෙන ඔය පොත පත කියල දෙන එකනේ. ඔය පොත පත කියලා දෙන තැනත් - ඔය ධර්මය නිසා - ඔය උගන්නන කෙනාට ගෞරවය නැති නිසා හිතේ - අධ්‍යාපනික වශයෙන් පසු බෑමක් සිද්ධවෙනවා නම්, ඒවාගේම ගුරු ගෞරවය ඇතුව ඉගෙන ගන්නදේට - උගන්වන කෙනාට ගෞරවයක් ඇතුව ඉගෙන ගන්ට කොට එයාගේ හිතේ ඒ ගතිය පිහිටනවා නම්, ඕකට වඩා දෙයක් ධර්මය ඉගෙන ගැනීම තුල තිබෙනවා - ඒ තමයි ධර්ම ගෞරවය තිබෙන්ට ඕනෑ. ඒවගේම ශාස්තෘ ගෞරවය තිබෙන්ට ඕනෑ. බුදුරජාණන්වහන්සේ කෙරෙහි හොඳ පහන් සිතක් සහ අපට මේ ටික කියල දීපු ගෞරවයක් - වන්දනා කිරීම් වශයෙන් - පූජා කිරීම් වශයෙන් - මෙනෙහි කිරීම් වශයෙන් - භාවනා කිරීම් වශයෙන් - හිතීම් වශයෙන් තියෙනවානම් ආන්න ඒක අපිට තව මේ ධර්මයට තව ටිකක් වේගයෙන් යන්ට උදව් වෙනවා. දැන් ඉතින් රහසක් නෙමෙයිනේ අපි මේ computer එක්කනේ මේ ගනුදෙනුව කරන්නේ. මෙහෙත් computer එකක් තිබෙනවා. මේ පින්වතුන් ගාවත් computer තියෙනවා. දැන් මේ සමහර වෙලාවට තියෙනවා මේ computer වල - ඉස්සර ඒවගේ තිබුණ එකක් ram අඩුයි කියල. ඒ ram කියල කියන්නේ computer එකට ලබා ගන්නාවූ වේගවත් භාවය ඇතිකරන යම්කිසි system එකක්. ram අඩු උනහම මේ computer එකට යම්කිසි දෙයක් එනඑක හරි හෙමිහිට සිද්ධ වෙන්නේ. Ram ගතිය වැඩි උනහම ඉකමනටම එනවා. දැන් අලුත් computer වල ඒක තියෙනවා. අපිටත් ඒවගේ තමයි. අපේ හිත්වලට සමහර ඒවා ගන්ට ගියන් පස්සේ කියවනවා කියවනවා - අහනව අහනවා - මේ පොත බලනවා - අර පොත බලනවා - බණ අහනවා - සාකච්ඡා කරනවා හැබැයි ඒකෙන් අවබෝධය එන්නේ හරි හෙමිහිට - ram අඩුයි. ඉතින් අපි යම් කිසි විදියකින් මේකෙ ram කෑල්ලක් හයි කරොත් අපේ හිතට - computer එකට නෙමෙයි අපේ හිතට වේගයෙන් ගන්න පුළුවන් ධර්ම එකතු කරන්ට ඕනෑ. එකතු කිරීමේ එක ක්‍රමයක් තමයි ඔය කියන්නාවූ වන්දනාවක් - පූජාවක් - ගරු කිරීමක් - ශ්‍රේෂ්ට පූජාවක් කරහම අපිට ඒක හරීයට උපකාර වෙනවා මේ උතුම් ධර්මය තව තව වේගවත්ව - වේගවත්ව - වේගවත්ව අපේ හිතට එකතු කරගන්ට - එක්කාසු

කරගන්ට. දැන් ඕක අපේ ජීවිතය තුලිනුත් දැකල තියෙනවා. මේ උතුම් ධර්මය අපේ බුදුරජාණන් වහන්සේගේ ගුණ සිහිපත්කරලා හිතන්ට ඕන මට මේක හොඳට පැහැදිලිව විසදව හොඳට තේරුම් ගන්ට වටහා ගන්ට ලැබේවා කියන අධිෂ්ඨානයෙන් බුද්ධ ගෞරවයෙන් ධර්ම ගෞරවයෙන් කරන්ට ඕන. ඒක නිසා මම මේකත් මේ අමතක වෙන්න කලියෙන් තමයි මේ මතක් කරේ. මම හිතන්නේ මීටත් කලින් කියන්න ඇති එහෙම නැත්නම් මේක අලුත් එකක් වේවි.

දැන් මම කියල දුන්නනේ 'අනන්තර' කියන වචනය. 'අන් + අන්තර' = අතරක් නෑ. අතරක් තියන්නේ නැතුව තවත් එහෙකට උපකාර වෙන්නාවූ ධර්මස්වභාවයට කියනවා 'අනන්තර ප්‍රත්‍යය' කියලා. හිතක් පහළ උනා - මොකක් හරි හිතක් - ඒ හිත පහළ වෙලා ඊළඟ හිත පහළ වෙන්න - ඒ කලින් පහළ වෙච්ච හිත ඊළඟට පහළ වෙච්ච හිතට උපකාර උනා - ඒදෙක මැදට වෙනත් එකක් සිද්දවෙන්න ඉඩ දෙන්නේ නැතුව. අන්න ඒවගේ උපකාරක ධර්මයට කියනවා 'අනන්තර ප්‍රත්‍යය සවභාවය' කියල. ඊළඟට අපි බලමු මේකේ භාෂා යෙදීම. මේ පාලි භාෂාවේ වචන යෙදීමේදී හරී පරෙස්සන් වෙන්න මේ පින්වතුන්. මේකෙ තියෙනවා සමාන වචන කීපයක්. ඒ සමාන වචන ටිකක් පටලැවෙන්න පුළුවන්. ඒක නිසා හොඳටම දැන ගන්න වචනය. මෙන්න මේ විදියටයි තියෙන්නේ. බලන්ට

**'චක්ඛුවිඤ්ඤාණධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො'** - ඔය විදියට තියෙන එක අපි බලමු - එකේ තියෙනවා **'විඤ්ඤාණධාතු'** – **'මනොධාතු'** – **'තංසම්පයුත්තකානඤ්ච ධම්මානං'** **'සම්ප්‍රයුක්ත ධර්ම'** යන වචන තිබෙනවා. එතකොට අපේ හිතට නිකං හැඟෙනවා 'මේ මොකක්ද - මේකෙන් කියන්නේ මොකක්ද - මේකෙන් කියන්නේ මොකක්ද කියල නිකං අපේ හිතට සැක මුසු තැන් ඇතිවනවා. සමහරවෙලාවට බයත් හිතෙනවා - මේක තේරෙයිද කියල එහෙමත් හිතෙනවා. මේ වචන හොඳට පැහැදිලිව තේරුම් ගන්න ඕන. දැන් අපි ගොඩක් මේ ගැන කියල තියෙනවනේ. මේ ගැන කථාකරලා තියෙන නිසා මේක තේරේවි.මේ පළවෙනි වචනේ.

**'චක්ඛුවිඤ්ඤාණධාතු'** – **'චක්ඛුවිඤ්ඤාණධාතු'** කියල කියන්නේ ඇහැ නෙවෙයි. ඇහේ නමත් එක්කාසු කරලා 'චක්ඛු' කියන්නේ ඇහැනේ - 'චක්ඛු' කියන ඇහේ නමත් පාවිච්චි කරලා 'සිත' ගැන කියන්නාවූ වගන්තියක් ඔය

තියෙන්නේ - **'චක්ඛුවිඤ්ඤාණධාතු'** = **'ඇසෙන් ගන්න රූපයක් දැන ගන්නා හිතනේ'**. ඕක අපි ගොඩ කියල තියෙනවනේ.

**'චක්ඛුවිඤ්ඤාණධාතු'** - ඇසෙන් රූප දකින හිත හෙවත් චක්ඛු විඤ්ඤාණය. ඒ චක්ඛු විඤ්ඤාණධාතුව - **'තංසම්පයුත්තකා ච ධම්මා'** - වෙන වචනයක් පාවිච්චි කරනවා මෙතැන. **'තංසම්පයුත්තකා ච ධම්මා'** කියල කියන්නේ ඒ චක්ඛු විඤ්ඤාණ ධාතුවේ පහළ වෙන්නාවූ චෛතසික ධර්ම ටික. ඒ චෛතසික ධර්ම කථාවක් නෑ මෙතන. වෙන වචනයක් තියෙන්නේ. චක්ඛු විඤ්ඤාණ ධාතුව ඊළඟට - **'තංසම්පයුත්තකා ච ධම්මා'** - ඒ හිතේ පහළ වන්නාවූ චෛතසික ධර්ම ටික ගත්තයින් පස්සේ තමයි චක්ඛු විඤ්ඤාණ ධාතුවේ සම්ප්‍රයුක්ත ධර්මයන් - සම්ප්‍රයුක්තක ධර්ම කියල කියන්නේ චෛතසික ධර්ම. එතකොට මෙතන පොකුරක් තියෙනවා. මේ පොකුරේ තිබෙනවා ධර්මතා 8 ක්. මොකක්ද? චක්ඛු විඤ්ඤාණයයි - ඒ චක්ඛු විඤ්ඤාණයේ තිබෙන්නාවූ ඵස්ස - වේදනා - සංඥා චේතනා - ඒකග්‍රතා - ජීවිතේන්ද්‍රිය - මනසිකාරය කියන්නාවූ චෛතසික ධර්ම 7 යි. ධර්මතා 8 ක් තියෙනවනේ එතකොට. චෛතසික ධර්ම 7 + සිතයි (චක්ඛු විඤ්ඤාණය). එතකොට මේ ධර්මතා 8 තමයි ඔය එක්කාසු කරලා තියෙන්නේ = **'චක්ඛුවිඤ්ඤාණධාතු තංසම්පයුත්තකා ච ධම්මා'** කියල - ඔය ටික එක වෙලාවකනේ පහළ වෙන්නේ. ඔය පොකුර - ඔය ධර්මතා 7 එක වෙලාවකනේ පහළ වෙන්නේ.

**'මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං'** = 'මනෝධාතුව කියල කියන්නාවූ එකක් තියෙනවා. ඒ මනෝධාතුවටයි ඒ හා සමග යෙදෙන්නාවූ සම්ප්‍රයුක්ත ධර්ම රංචුවටයි'

මනෝධාතුව කියල කියන්නේ මොකක්ද? මනෝ ධාතුව කියල කියන්නේ 'සම්පටිච්ඡන හිත'. 'සම්පටිච්ඡන හිතට' කියනවා මනෝ ධාතුව කියල. මනෝ ධාතු තවත් තියෙනවා. පංචද්වාරාවජ්ජන හිතයි සම්පටිච්ඡන සිත් දෙකයි - කුසල සහ අකුසල් සිත්. හැබැයි මෙතැනදී සම්පටිච්ඡන සිතට කියනවා මනෝ ධාතුව කියල. සම්පටිච්ඡන සිතේ තිබෙනවා චෛතසික ධර්ම සමූහයක්. ඒ ටික තමයි ඵස්ස - වේදනා - සංඥා චේතනා - ඒකග්‍රතා - ජීවිතේන්ද්‍රිය - මනසිකාර - විතර්කය - විචාර - අධිමොක්ඛය යන චෛතසික ටිකට කියනවා **'සම්ප්‍රයුක්තකාච ධම්මා'** කියල. මනෝධාතුව ඇතුලෙ - ඒ කියන්නේ 'සම්පටිච්ඡන' හිත ඇතුලේ

පවතින්නාවූ ධර්මයන් - චෛතසිකයන් - ඒක නිසා තමයි 'සම්ප්‍රයුක්තක ධර්මයෝ' කියල කියන්නේ. මේ සම්පටිච්ඡන සිත පහළ වෙන්න කලියෙන් පහළ උනේ මොකක්ද? චක්ඛු විඤ්ඤාණ සිත ඊට පස්සේ පහළ උනේ මොකක්ද සම්පටිච්ඡන සිත. ඒ චක්ඛු විඤ්ඤාණ සිතටත් සම්පටිච්ඡන සිතටත් මැදින් මොහකටවත් එන්න නොදී - මොහොකටවත් පනින්ට නොදී - මොහොකටවත් ඇතුලට රිංගන්න නොදී - චක්ඛු විඤ්ඤාණ සිත උදව් උනා - උපකාර උනා **මනෝධාතුව** කියන්නා වූ **සම්පටිච්ඡන සිතටත්** ඒ පහළ වන්නාවූ චෛතසික ධර්ම 10 ටත් අතරක් තියන්නේ නැතුව උපකාර උනා. **ඒක 'අනන්තරපච්චයෙන පච්චයො' = 'අතරක් නැතුව උපකාර උනා'.** ආන්න ඒක තමයි කියන්නේ **'චක්ඛුවිඤ්ඤාණධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො'** කියල. දැන් ඒ දෙක අතර වෙන මොකක්වත් නැනේ.

දැන් අපි මෙහෙම හිතුවොත් එහෙම - දැන් මේ කථා කරන්නේ එක චිත්ත වීථියක් ගැන. අපේ පින්වතුන් දන්නවා චිත්ත වීථි පිළිබඳව. චිත්ත වීථියක් කියල කියන්නේ අරමුණක් දැන ගැනීම සඳහා භවංග සිතේ ඉදල භවංග සිතෙන් පරිවර්තනය - වෙලා භවාංග සිතෙන් වෙන්වෙලා - අයින්වෙලා - අරමුණ පැත්තට දිව යන්නාවූ - එක්තරා වේගයකින් දිව යන්නාවූ සිත් වැලක් - සිත් පේළියක් - චිත්ත ධාරාවක් - සිත් සමූහයක්. ඒ සිත් සමූහයට සිත් වැල හෙවත් චිත්ත වීථිය කියල කියනවා. ඒ චිත්ත වීථියක් යන හැඩ තලේතමයි මේ කියන්නේ. චක්ඛු විඤ්ඤාණ ධාතුව පහළ උනා චිත්ත වීථියේ එක තැනක. එතනින් පස්සේ සම්පටිච්ඡන සිත පහළ වෙනවා මනෝ ධාතු නමින්. ඒ පහළ වෙන කොට ඒකෙ සිද්ධ වෙච්ච අනන්තර ස්වභාවය තමයි මේ කිව්වේ.

දැන් අපි මෙහෙම හිතමු. මේ වෙන කථාවක් කියන්න යන්නේ. දැන් දෙවනුව පහළ උනේ මොකක්ද? මනෝ ධාතුව පහළ උනා. දැන් ඒ මනෝ ධාතුවේ නවතිනවද? නෑ. **'මනොධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනෝවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො'.** ඔතනින් නවතින්නේ නෑ. නවතින්නෙ නැතුව ඊට පස්සේ යනවා - ජවන් සිත් කියල ටිකක් තියෙනවනේ - මනෝධාතුවෙන් පස්සේ යනවා මනෝවිඤ්ඤාණ ධාතුවට - ඒ මනෝවිඤ්ඤාණ ධාතු අතර විශේෂයෙන්ම සලකනවා ජවන් - ඊළඟට සන්තීරණ සිත යනවා මනෝ විඤ්ඤාණ ධාතු හැටියට. ඒවා හැබැයි ක්‍රියා සවභාව. විශේෂයෙන්ම ගන්නවා ජවන් සිත්. ඒ ජවන්

සිත්වලට සහ ඒවාගේ තියෙන්නාවූ චෛතසික ධර්මයන්ට අතරක් තියන්නේ නැතුව අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වෙනවා. දැන් මේක පහළවෙන ආකාරය තමයි ඔය කියන්නේ - දැන් සිතක් පහළ උනා - ඒ කියන්නේ මනෝ ධාතුව - මනෝ ධාතුවට පස්සේ පහළ වෙච්ච මනෝ විඥ්ඥාණ ධාතුවට මනෝ ධාතුව උපකාර වෙච්ච ආකාරය ඔය විදියට කියනවා. අනන්තර සවභාවයක් තියෙනවා.

පළමුවෙන් පළමුවෙන් පහළ වෙන්නාවූ සෑම සිතක්ම ඊට පස්සේ පස්සේ පහළ වෙන්නාවූ සෑම සිතකටම උපකාර වෙනවා. ඒ උපකාර වීම් ගතියක් තිබෙනවා. ඒ උපකාර වීම් ගතියක් තිබෙන හින්ද තමයි ඒ විදියට වෙන්නේ. ප්‍රශ්නයක් හිටිනවා ඔතන.

දැන් සංසාර ගත සත්වයෙකුට සිද්ධවෙනවා යම්කිසි ප්‍රතිසන්ධි සිතක් ඇතිවුනායින් පස්සේ - ඒ ප්‍රති සන්ධි කියලා කියන්නෙත් අමුතු දෙහෙකුත් නෙමෙයි - ප්‍රතිසන්ධි හිත කියල කියන්නේ ඔය සංසාරයේ පැවතගෙන එන්නාවූ චිත්ත ප්‍රවාහයේ තවත් එක තැනක් විතරයි. ඒක - ඒ එක gap එහෙක - එක ආරම්භක අවස්ථාවක් - ප්‍රතිසන්ධි සිත කියල කියන්නේ. ඒ ප්‍රතිසන්ධි සිතෙන් ඒක නවතින්නේ නෑ. ප්‍රතිසන්ධි සිත හට ගන්නෙත් ඉස්සරවෙලා ඇතිවෙච්ච චුති සිතක - උලුප්පා දීමක ප්‍රතිඵලයක් හැටියට. ප්‍රතිසන්ධි සිතෙන් පස්සේ නවතින්නේත් නෑ මේක. ඊට පස්සෙත් ඒක භවාංග සිතට අල්ලවල දෙනවා. භවංග සිතයි ප්‍රතිසන්ධි සිතයි අතර වෙන මොකක්වත් හටගන්න ඉඩ තියන්නෙත් නෑ. වෙන මුකුත් ඉඩ තියන්නේ නැතුව ඒකත් ඒ විදියට වෙනවා. භවාංග සිත් පේළියක් ගියැන් පස්සේ ඒ භවාංග සිත් දිගට එකක් පස්සේ එකක් - එකක් පස්සේ එකක් - ඔය විදියට දිගට තල්ලු කරගෙන - තල්ලු කරගෙන - තල්ලු කරගෙන යනවා. නිරෝගීමත් ප්‍රසාදයකට ගැටිච්ච අරමුණක් හින්ද අර භවාංග ප්‍රවාහය නවතින තෙක් ඒ භවාංග සිත් පේළියත් ඉස්සරහට යනවා. එකකට පස්සේ එකක් - එකකට පස්සේ එකක් වශයෙන්. එතකොට මේක නවතින්නේ නෑ. හැම වෙලාවේම පිටිපස්සෙන් එන භවාංග සිත - අර ඉදිරියෙන් ඉදිරියෙන් පහළ වෙවී යන්නාවූ භවාංග සිත් පේළියටත් - ඊළඟට ක්‍රියාත්මක සිත් පේළියටත් ඔය විදියට - ඔයවිදියට තල්ලු කරගෙන යනවා. මේක ඉස්සරහට යන්නේ පළමු පළමු - පළමු පළමු සිත් ටික මේ පස්සේ පස්සේ එන ඒවාට පරම්පරාව ගෙනියන්ට උදව් කරන්න වගේ උපකාරවන ගතියක් තියෙනවා - අතරට එන්න නොදී.

දැන් ඕලාරික උපමාවක් අරන් බැලුවොත් යම්කිසි පවුලක පරම්පරාවක් තියෙනවා කියල කියනවා. එතකොට තාත්ත නිසා දෙමව්පිය සංයෝගයෙන්

පුතා. ඒ පුතා නිසා තව දරුවෝ. ඒ දරුවෝ නිසා තව දරුවෝ. ඔය විදියට අතීතයේ ඉඳල මේ විදියට පරම්පරාවෙන් පරම්පරාවට අතරක් නැතිව මේක ගෙනාවානම් ඒක ඇවිල්ල ඒ පවුලේ පරම්පරාව. එතකොට කොතනින් හරි බිඳී යන්න අතරට යමක් එන්නේ නැතුව දිගට ගියොත් එහෙම අනිවාර්යෙන්ම දිගටම පවතිමින් යනවා. ඕක ඕලාරික උපමාවක්.

සියුම්ව ගත්තොත් එහෙම මේ ක්‍රියා ධර්ම ටික එකකට එකක් පිටිපස්සෙ එනවා. මේක නිසා ඉස්සරවෙලා ඉස්සරවෙලා ඇතිවෙන එක පස්සේ පස්සේ හිත්වලට උලුප්පවලා - ගැම්මදීලා - ගස්සල - ඒකට උදව්කරන නිසා මේ හිත් ප්‍රවාහය නවතින්නේ නෑ. මේ හිත් ප්‍රවාහය දිගට යනවා මේක නවතින්නේ නෑ. හැම හිතකටම - දැන් බලන්ට එකම එක හිතක් තියෙනවා, ඒ හිත විතරයි අනන්තර ප්‍රත්‍යය දාල කථාකරන්නේ නැත්තේ. ඒ තමයි යම් කිසි දවසක රහත් උනාම රහතන්වහන්සේගේ සිත. රහතන්වහන්සේගේ සිතේ තිබෙනවා කාමාවචර කුසල විපාක හරි - ක්‍රියා සිත් හරි දිගට යන ගතියක් තියෙනවා. උන්වහන්සේගේ සිතෙත් භවාංග සිත් තියෙනවා. උන්වහන්සේගේ සිතේ සමාපත්ති සිත් පහළ වෙනවා. ඊට පස්සේ මාර්ග සිත් නම් එකයි තියෙන්නේ. හැබැයි අනිත් හැම අවස්ථාවකදීම කාම ලෝකයට සම්බන්ධ ක්‍රියා සිත් හෝ අහේතුක සිත් පහළ වෙනවා ජවන් සිත් පහළ වෙනවා. ඊළඟට ක්‍රියා සිත් පහළ වෙනවා. ඊළඟට සමාපත්තියට සමවදින අවස්ථාවේදී සමාපත්ති සිත් පහළ වෙනවා. හැබැයි යම් කිසි වෙලාවක රහතන්වහන්සේගේ චුති සිත පහළ උනහම 'චුති සිත' විතරයි ඉස්සරහ හිත පහළ වෙන්ට යම් ගැම්මක් දී ගන්ට බැරි සිත - රහතන් වහන්සේගේ චුති සිත. රහතන්වහන්සේ චුත වන්නේ උන්වහන්සේගේ ප්‍රතිසන්ධි සිතට සමාන සිතකින්. මේකේ අමුතුම ගතියක් තියෙනවා.

කවුරුහරි කෙනෙක් මනුස්ස ලෝකේ උපදිනකොට ප්‍රතිසන්ධි සිතක් තියෙනවා. ඊට කලින් හිටිය දිව්‍යලෝකේ. දිව්‍යලෝකේ ඉන්නකොට ඒත් භවංග සිතක් තිබුන. එතනින් චුත උනා. ඒ චුතවෙනකොට චුති සිතට පස්සේ පහළ වෙනවා මනුස්සලෝකේ ප්‍රතිසන්ධි සිත. එතකොට ඒ චුතිසිත උනාට ඉවර නෑ. මනුස්සලෝකේ ප්‍රතිසන්ධි සිතක් පහළ උනා. එතකොට ඒ ප්‍රතිසන්ධි සිතට ගැම්මක් තිබුනනේ පස්සෙන් තල්ලුකරලා දුන්නනේ. මේ දිව්‍යලෝකයේ ඉඳල මනුස්සලෝකයට ආපුකෙනාගේ ප්‍රතිසන්ධි සිත තිබෙනවා - ප්‍රතිසන්ධි සිතට අරමුණු වෙච්ච යම් කිසි ධර්මස්වභාවයක් තිබෙනවා - කර්මය - කර්ම නිමිති -ගති

නිමිති කියන ඒවා. ඊට පස්සේ ඒවගෙන්ම එකක් අල්ලගෙන භවාංග සිත් පේළියක් දිගට යනවා. ඊළඟට චුතිය සිද්ධවෙනවා. ප්‍රතිසන්ධිය - භවාංගය - චුතිය අරමුණු තුන සමානයි හැබැයි මේ රහතන්වහන්සේගේ 'චුති සිතේ' තිබෙන ආශ්චර්ය තමයි අනන්තර ප්‍රත්‍යය නෑ. ඉස්සෙල්ල පහළ වෙච්ච හැම හිතක්ම පස්සේ පස්සේ - පස්සේ පස්සේ පහළ වෙන හිත්වලට අනන්තර ප්‍රත්‍යය ගැම්ම අල්ලලා දුන්නා. හැබැයි රහතන් වහන්සේගේ 'චුති සිතේ' ඒක නෑ. ඊට ඉස්සෙල්ල ඒවගේ තිබුන. ඒ නිසා හැම හිතකම චෛතසික ධර්මයෝ - ඉස්සරවෙලා ඉස්සරවෙලා පහළවෙන සෑම සිතකම තිබෙනවා පස්සට තල්ලුකරලා දෙන ගතියක්. රහතන්වහ්සේගේ චුති සිත - ඒකත් මොකක් හරි චෛතසික ගොන්නක් එක්කනෙ තියෙන්නේ. ඒකට විතරයි ඔය වැඩේ කරන්න බැරි.

තව එකක් තියෙනවා මෙහෙම. දැන් මම මේක කියාගෙන යනකොට මෙහෙම කථාවක් කිව්වා. ඒ තමයි ඉස්සරවෙලා ඉස්සරවෙලා පහළවෙන චිත්ත ධර්මයෝ - චෛතසික ධර්මයෝ ටික - පස්සේ පස්සේ පහළ වෙන ඒවාට උදව් වෙනවා කියල. ඒ කියන්නේ අනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙනවා කියල. හැබැයි එහෙම වෙන්නේ නැති ඒවත් තියෙනවා. ඒ වෙන්නේ නැති ඒවා තමයි ඔය හිතක් පහළ වෙනකොට පහළවෙනවා චිත්තජ රූප කියල කොටසක්. ඒ චිත්තජ රූප ටිකට ඊළඟට ප්‍රතිසන්ධිය හින්ද හැදෙන රූප වලට (ඒක කර්මජ රූපයක්) - බාහිරෙන් පහළ වෙන බාහිර රූප වලට - .........ආහාර රූප වලට - ඍතුව නිසා හටගන්නා ඍතුජ රූප වලට - ඒවට ඉස්සර ඉස්සර වෙලා - ඉස්සර වෙලා පහළ වෙන සිත් අනන්තර ප්‍රත්‍යයයෙන් බලපෑමක් කරන්න නෑ. ඒවා රූප වැල් හැටියට ඔහේ පහළ වේගෙන යනවා. හිත තියෙනවා - කර්මය තියෙනවා - ඊළඟට බාහිර ඍතු ගුණය තියෙනවා - ආහාර ස්වභාවය තිබෙනවා ඒවා නිකන් පහළ වෙනවා - හැබැයි ඒවා අනන්තර ප්‍රත්‍යය වශයෙන් ගණන් ගන්නේ නෑ. ඒ කියන්නේ ඒවා - ඉස්සෙල්ල හිතක් නිසා පහළ වෙච්ච ඒ අනන්තර ප්‍රත්‍යයයේ ගැම්ම ලබන්නේ නෑ. හැබැයි පස්සේ ඒවත් තියෙනවා හැබැයි ප්‍රත්‍යය ලබන්නේ නෑ. ඒක නිසා ඒවා ප්‍රත්‍යනීක ධර්ම හැටියට සඳහන් කරනවා. අපි විස්වාස කරනවා මේ පින්වතුන්ට මේක තේරෙන්න ඇති කියල.

ඔක ස්ථාන 5 ටම දාන්න ඕන. චක්ඛුවිඤ්ඤාණධාතු - සොතවිඤ්ඤාණධාතු - ඝානවිඤ්ඤාණධාතු - ජිව්හාවිඤ්ඤාණධාතු - කායවිඤ්ඤාණධාතු. මේ දොරවල්

විතරයි වෙනස් - අරමුණු විතරයි වෙනස් - අනිත් ඇතිවන ඔය සිත නිසා පහළ වන චිත්ත සංකලනය - චිත්ත ධර්ම අරමුණු වශයෙන් වෙනස් උනාට ඒවා පහළ කරන - මතුවන ඒ ධර්ම එක සමාන වෙනවා. ඒවා ඔය කියපු හැටියට මනෝ විඤ්ඤාණධාතුවට ඒ චෛතසික ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙනවා.

තවත් අපි එකක් හිතමු. ඒ තමයි යම්කිසි වෙලාවක ඒක මේ පින්වතුන්ට කියවන්ට ලබුනොත් මේ විදියට මූණ ගැසේවි පද පේළිය -

**'පුරිමා පුරිමා කුසලා ධම්මා'** = 'පළමුවෙන් පළමුවෙන් පහළ වන්නාවූ කුසල ධර්මයෝ'

**'පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො'** = 'පසුව පසුව පහළ වන්නාවූ කුසල ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි'

ඕක කොහොමද තේරුම් ගන්නේ කියලත් ටිකක් හිතන එක හොඳයි. හරිම ලස්සන ධර්මයක් ඕක. හරිම විසිතුරු ධර්මයක්. ඒ තමයි කුසල ධර්ම කියල අපි කථා කරන්ට යන තැන මොකක්ද? කුසල ධර්ම කියල කථා කරන්ට යන තැන තමයි අපි හිතමු යම්කිසි කෙනක් බුද්ධ වන්දනාව කරනවයි කියල. බුදුරජාණන්වහන්සේ සිහිපත් කරගෙන බුදුරජාණන්වහන්සේ හිතින් බලාගෙන බුදුරජාණන් වහන්සේ හිතින් දැකගෙන අරමුණු කරගෙන හොඳ ශාන්ත වන්දනාවක් සිද්ධ කරනවා. ඒ වන්දනාව සිද්ධ කරන වෙලාවේ එයාගේ හිතේ පහළ වෙනවා කුසල් චිත්ත වීථි ගොඩ පහළ වෙනවා. සිත් අවස්ථා 17 ඒවා - චිත්තක්ෂණ 17 ක් වැඩ කරන සිත් පේළි ගොඩාක් පහළ වෙවී - පහළ වෙවී බුදුරජාණන්වහන්සේ ගැන හිතනවා - ගාථා කියනවා - වඳිනවා. ඕක කරගෙන යනකොට මේ සිත් පේළි වල මැද්දැවක පහළ වෙනවා ජවන් සිත් කියල. අපි දන්නවනේ ඒක. ඒ ජවන් හරියේ තමයි කුසල් පහළ වෙන්නේ. පිං සිද්ධ වෙන්නේ. ඒ ජවන් සිත් පහළ වෙන්න කලින් සිත් තියෙනවනේ මෙහෙම - හොඳට බලන්ට - සිහිගන්වා ගන්ට හිතට - මතක් කරව ගන්න අපේ පින්වතුන්

- භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද - මනෝද්වාරාවජ්ජනයට පස්සේ ජවන් යනවා.

ගාථා කියනවානම් මේ විදියට යනවා

- භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද - පංචද්වාරාවජ්ජන... ඊට පස්සේ ගාථා කියනවානම් අරමුණුකිරීම් වශයෙන් බුදුපිළිමයක් හිතා ගත්තොත් බුදුපිළිමයක් අරමුණු කර ගත්තොත් .. චක්ඛු විඤ්ඤාණ - සම්පටිච්ඡනය - සන්තීරණය - වොත්තපනය - ජවන් -ජවන්- ජවන්- ජවන් -ජවන් -ජවන් -ජවන් - තදාරම්මණ - තදාරම්මණ ..ඊළඟට භවාංග ගතවෙනවා.

දැන් ඔය පිළිමයක් අරමුණු කිරීම් වශයෙන් පේළියක් ගිහිල්ලා. ඒකෙ තිබුනනේ ජවන් මැද්දැවක. ඒක හිතට යනවා මනෝද්වාරාවජ්ජන හැටියට මනෝද්වාරික සිත් පහළ වෙනවා මේ විදියට.

- භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද - මනෝද්වාරාවජ්ජන - ජවන් - ජවන් - ජවන් - ජවන් - ජවන් -ජවන් -ජවන් තදාරම්මණ - තදාරම්මණ - භවාංග (අරමුණු කිරීම් වශයෙන් සමහර තැන්වල තදාරම්මණ දෙකක් යනවා) මෙහිදී බුදුගුණ හිතීම් වශයන් ජවන් පහළ වෙලා ඊළඟට භවාංග ගතවෙනවා .

දැන් මේ මනසේ යන චිත්ත වීථිවල තියෙනවනේ ජවන් කොටසක්. ජවන් හරියේ තමයි කුසල් පහළ වෙන්නේ. පින්සිද්ධ වෙන තැන්. කුසල් වැඩෙන තැන්. කුසල් අහුවෙන තැන්. ඒවාට කියනවා ඒ තැන් 'කුසලා ධම්මා' කියලා. 'කුසලා ධම්මා' පළවෙනි ජවනය - දෙවෙනි ජවනය - තුන්වෙනි ජවනය - හතරවෙනි ජවනය - පස්වෙනි ජවනය - හය වෙනි ජවනය - හත්වෙනි ජවනය යන කුසල් පේළියේ **'පුරිමා පුරිමා කුසලා ධම්මා'** කියල කියන්නේ පළමුවෙන් පහළ වෙච්ච කුසල් ජවනය දෙවෙනි කුසල් ජවනයට උපකාර වෙනවා - **'පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං'**- එතන කුසල ධර්ම කියල කියනකොට ධර්ම අපි ගත්තොත් එහෙම - දැන් බුද්ධ වන්දනාවක්නේ මේ කරන්නේ - බුද්ධ වන්දනාව කරන කොට මෙතන කුසල ධර්ම කියල කියන්නේ මොනවාද? කුසල ධර්ම කියල කියන්නේ - එතන තියෙනවා චෛතසික ධර්ම රාශියක්. ඒක මේ විදියටයි ගණන්ගන්නේ. පළවෙනි ජවනයේ තිබෙනවා කුසල ධර්ම 34 ක්. ඒ 34 ගණන් ගන්නේ මේ විදියට.

පළවෙනි ජවන් සිතේ සර්ව චිත්ත සාධාරණ චෛතසික 7 + ප්‍රකීර්ණක 6 = 13 + අනිවාර්යෙන්ම තිබෙන සෝභන චෛතසික 19 = 32 + ප්‍රඥාව අනිවාර්යෙන් තිබිය යුතුයි බුදුගුණ සිතන නිසා. එතකොට චෛතසික ධර්ම 33 + ජවන් හිත = 34 යි. 'හිතයි' + චෛතසික ධර්ම 33 = 34 යි. ඔය ධර්ම 34 - එනම් හිතයි

චෛතසික ධර්‍ම 33 ටයි කියනවා **'කුසලා ධම්මා'** කියල. ඔය කුසල ධර්‍ම රංචුව **'පුරිමා පුරිමා කුසලා ධම්මා'** = 'පළමු පළමු කුසල ධර්‍මයන්ට' – **'පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං'** = 'පසුව පහළ වෙන්නාවූ නොහොත් දෙවෙනි සිත - ඊට පස්සේ තුන්වෙනි හිත - තුන්වෙනි සිතෙන් හතරවැනි සිත ....' මේ සිත් වලත් පහළ වෙනවා අර වගේම චෛතසික ධර්‍ම 33 එක්ක සිත. එතකොට 34 යිනේ.

පළමුවෙන් පළමුවෙන් පහළ වෙන්නාවූ ජවන් සිත්වල පහළ වන කුසල ධර්‍ම පසුව පසුව පහළ වෙන්නාවූ කුසල ධර්‍මයන්ට ඒ මැද්දෑවට වෙන අකුසලයකට හරි ඒ මැද්දෑවට වෙන අහේතුවකට හරි ඒ මැද්දෑවට වෙන ක්‍රියාවකට හරි ඒ මැද්දෑවට වෙන සමාපත්ති හිතකට හරි මොකකටවත් රිංගන්න නොදී හරියට ඒ මණ්ඩලයට සමානව අවස්ථාව සපයා දෙමින් ඒවා පහළ වෙන්ට හරිනවා. ඒ කුසල ධර්‍මයන් පසුව පසුව පහළ වන්නාවූ කුසල ධර්‍මයන්ට උපකාර වෙනවා. දැන් මේවා පහළ වෙලා - පහළ වෙලා ගියානේ. පහළ වෙලා ගිහිල්ලා දැන් ප්‍රශ්නයක් ඇතිවෙනවා. ප්‍රශ්නේ ඇතිවන්නේ මේ විදියටයි. ඒ තමයි - දැන් මේ කථාව කියාගෙන යනකොට පළමුවෙන් පහළ වෙච්ච කුසල් ධර්‍මයෝ නෙ. පළමුවෙන් පහළ වෙච්ච කුසල ධර්‍මයෝ දෙවෙනි එකට උපකාර වෙනවා. දෙවෙනි එකේ පහළ වෙච්ච කුසල ධර්‍ම රංචුව තුන්වෙනි එකට උපකාර වෙනවා. තුන්වෙනි හිතේ කුසල ධර්‍ම රංචුව හතර වෙනි එකට උපකාර වෙනවා. හතරවෙනි එකේ කුසල ධර්‍ම රංචුව පස් වෙනි එකට උපකාර වෙනවා. පස්වෙනි ජවනයේ කුසල ධර්‍ම රංචුව හයට උපකාර වෙනවා. හයවෙනි එකේ කුසල ධර්‍ම සමූහය හත්වෙනි එකට උපකාර වෙනවා. එතකොට හත්වෙනි හිතේ කුසල ධර්‍ම සමූහය - හත්වෙනි ජවනයේනේ - ඒකෙත් තියෙනවනේ අර ගානම. චෛතසික ධර්‍ම 33 යි හිතයි = 34 යිනේ. මේ ටිකත් කුසල ධර්‍මයෝ නෙ. එතකොට එතන කොහොමද වැඩේ සිද්ද වෙන්නේ කියල.

එතනදී වෙන්නේ මෙහෙමයි. **'පුරිමා පුරිමා කුසලා ධම්මා'** කියල කිව්වම අවසාන 7 වෙනි ජවනයේ කුසල ධර්‍මයෝ **'පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං'** - අබ්‍යාකත ධර්‍මය කියල කියන්නේ - අපි හිතමු භවාංග සිතක් පහළ වෙනවා කියල. එහෙම නැත්නම් තදාරම්මණයක් පහළ වෙනවා කියල, ආන්න ඒ තදාරම්මණ කියන ඒවා කුසල් සිත් නෙවෙයි. ඕවා අව්‍යාකෘත ධර්‍ම. අව්‍යාකෘත ධර්‍මවල තිබෙනවා - ක්‍රියා අව්‍යාකෘත කියල කොටසක් තිබෙනවා - විපාක අව්‍යාකෘත කියල කොටසක් තියෙනවා. ආන්න ඒ කොටසේ ගිහිල්ලා හැප්පෙනවා. පළවෙනි කුසල හිත - දෙවෙනි කුසල හිත.. තුන්වැනි ..හතරවැනි

..පස්වැනි .....හයවැනි ... හත්වෙනි එක ඊට පස්සේ ඒක අව්‍යාකෘත ධර්මයකට අනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙනවා. ඒ දෙන්න අතරට වෙන මොහොකටවත් රිංගන්ට නොදී. ඒක තමයි කියන්නේ **'පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො'** කියල.

අකුසලයටත් ඒ වගේ. ඉතින් ඔය විදියට බුදුරජාණන් වහන්සේගේ මේ ධර්ම විග්‍රහ සමූහයේ - පට්ඨාන ධර්ම කාණ්ඩයේ 4 වෙනි ධර්මය 'අනන්තර ප්‍රත්‍යය' හැටියට ප්‍රත්‍යය වෙන ආකාරය බුදුරජාණන් වහන්සේගේ ඒ විස්තරයේ තියෙන විදිය ඔය විදියට සඳහන් වෙනවා.

ඉතින් මේක දිහා බලාගෙන ගියැන් පස්සේ අපි හිතමු අපි බණක් අහනවා වගේ නෙමෙයි අපි නිකං අපේ හිත දිහා බලාගෙන හිටියොත් - අපේ හිතේ ක්‍රියාකාරී සවභාවය බලාගෙන හිටියොත් බුදුරජාණන් වහන්සේ අරමුණු කරනකොට අපිට කුසල සිත් පහළ වෙනවා කියල අපිට හිත හඳුනා ගන්න පුළුවන් උනොත් අපිට තේරෙනවා නියම වශයෙන්ම මේ හිත් වල ජවන් පහළ වෙනවා කියල. ඒ ජවන් සමහර ඒවා ක්‍රියා ජවන්. ඒ රහතන් වහන්සේලාට. අනිත් හැම එක්කෙනාටම කුසල ජවන් - ආරම්මණය ආර්ය ආරම්මණයක් වෙන නිසා - බුදුරජාණන්වහන්සේ වෙන නිසා. එතකොට බුදුරජාණන්වහන්සේ අරමුණු කරගෙන පහළ වෙන කුසල් සිත් පේළියේ ජවන් සිත් පහළ වෙනවනේ. ඒ ජවන් සිත්වල මේ ධර්ම සමූහය තියෙනවා. මගේ හිතේ මේ ධර්ම සමූහය එකින් එකට - එකින් එකට - පසු පසුව පහළ වන සිත් වලට කලියෙන් කලියෙන් පහළ වී පහළ වී මැකී ගිය සිත් ටික උදව් වෙනවා නේද - උපකාර වෙනවා නේද - අනිවාර්යෙන්ම ඒක හින්ද නේද මේ පසු පස සිත් පහළ වෙන්නේ කියල හොඳට මනසිකාර වශයෙන් දැන ගන්ට පුළුවන් - මනසිකාර වශයෙන් දැන ගන්ට පුළුවන්. ඒ සිත් පේළියක් එකට තියෙන නිසා තමයි හඳුනා ගන්ට ලේසි. භාවනා මනසිකාරයක් හැටියට අපිට හොඳට මෙනෙහි කරන්ට පුළුවන් මෙහෙමයි මේක සිද්ධ වෙන්නේ කියල. එතකොට ධම්මාරම්මණ මනසිකාරයක් වෙනවා. දැන් ඔය උපමාවකට ගත්තේ බුද්ධාරම්මණ මනසිකාරය.

සිතෙන්ම සිත දිහා බලනකොට - මේ හිත - බුදුගුණ අරමුණු වෙනකොට මෙහෙමයි වෙන්නේ කියල - හිත කියන ධර්ම ස්වභාවය පිළිබඳව මෙනෙහි කරනවා. හිත කියන ධර්ම ස්වභාවය පිළිබඳවම මෙනෙහි කරනවා තව සිත් පේළියකින්. එතකොට ඒ හිත්වලට මෙනෙහි වෙන්නේ අරමුණු වෙන්නේ අර බුදුගුණ මෙනෙහි කරපු සිත් පේළිය. එතකොට සිත් කියන්නාවූ - චෛතසික ධර්ම

කියන්නාවූ ධර්ම ස්වභාවය මෙනෙහි කරන තව සිත් පේළි පහළ වෙනවා. ඒවගෙන් අර බලාගෙන යනකොට එතනත් පහළවෙන්නේ මේ විදියටයි - කුසල ධර්මයෝ කුසල ධර්මයන්ට උපකාර වෙනවා අනන්තර වශයෙන් - කුසල් ධර්මයෝ අව්‍යාකෘතයන්ට උපකාර වෙනවා අනන්තර වශයෙන් - අව්‍යාකෘත ධර්මයෝ අව්‍යාකෘත ධර්මයන්ට උපකාර වෙනවා අනන්තර වශයෙන් කියල හොඳට අපිට දැනගන්න පුළුවන් සහ මෙනෙහි කරල තේරුම් ගන්න පුළුවන්.

ඊළඟට තවත් එකක් තියෙනවා මේ විදියට

**'යෙසං යෙසං ධම්මානං අනන්තරා'** = යම් කිසි ධර්මතාවයකට පස්සේ

**'යෙ යෙ ධම්මා උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා'** = යම් කිසි චිත්ත චෛතසික ධර්මයෝ පස්සේ පස්සේ පහළ වෙනවානම්

**'තෙ තෙ ධම්මා තෙසං තෙසං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො'** = ඒ ඒ පසුව පසුව පහළ වෙන්නාවූ ධර්මයන්ට කලින් කලින් පහළ වෙන ධර්මයෝ ඒකාන්තයෙන්ම අනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙනවා කියන එක සඳහන් කරනවා - ඒක පොදු වශයෙන් නම් ගම කියන්නේ නැතුව.

ඔය විදියට අපි ධර්මය මෙනෙහි කරන්ටත් හිතන්ටත් හිත පුරුදු කල යුතුයි. එතකොට අවබෝධයයි වැටහීමයි මනසිකාරයයි භාවනාවයි ධර්මානුසතියයි ඔක්කොම හොඳට සිද්ධවෙනවා. ඉතින් මම අද දවසේ මේ පින්වතුන්ට මතක් කරලා දුන්නේ මේන්න මේ කරුණු ටික. මම යම්කිසි වේලාවක මේක කියන්ට ඇතෙයි කියලත් හිතෙනවා. මම සමහර තැන වලදී ප්‍රකාශ කරලා තියෙනවා මේ ධර්ම කාණ්ඩය. හේතුව මේ ධර්ම කොටස් ගොඩාක් ගාම්භීරයි. ඒ කියන්නේ සියුම් වැඩි නිසා. සියුම් වැඩි නිසා හරිම ගාම්භීරයි - සමහර ඔය පට්ඨාන ධර්මයන්ගේ තිබෙනවා ලේසියෙන් කථා කරන්න පුළුවන් දේවල්. ඒවා ලේසිම නෑ නමුත් මේ වටපිටාව පොඩ්ඩක් එක්කාසු කරගෙන ඇඳගෙන ටිකක් සරලව ගොනු කරලා හිත්වලට ගන්න පුළුවන් සමහර ඒවා තියෙනවා. ඒවගේ නිසා මම කීප පලක ඔය ලේසි ලේසි වගේ හිතෙන ඒවා අපේ ධර්මකාමී පින්වතුන්ට කියල දෙන්නේ එතකොට නිකං අර හිතට ඒකෙ රසයක් තියෙනවා. ඒක නිසා මම සමහර වෙලාවට ඉස්සර වෙලා කියන්න ඇතියි කියල හිතනවා. අද මේ ටික තමයි අපි ඉදිරිපත්කරේ. මේ පින්වත් සැමදෙනාටම ඒකාන්තයෙන්ම ලොව්තුරා බුදුරජාණන්වහන්සේ - සත්වයෙක් නෑ - ධර්ම විතරයි - පුද්ගලයෙක් නෑ - ධර්ම

ස්වභාව විතරයි පවතින්නේ - ආත්මයක් ජීවයක් කෙනෙක් නෑ. ධර්‍ම ස්වභාව විතරයි පහළ වෙන්නේ. ඒවාගේම මේ ධර්‍මයෝ ධර්‍මයන්ගේ උපකාරය ලබාගෙන ධර්‍මයෝ හැටියටම පහළ වෙනවා. ධර්‍මයෝ තවත් ධර්‍මවල උපකාරය ලබාගෙන ධර්‍ම ස්වභාව හැටියටම ලෝකයේ පවතිනවා. ඒවාගේම ධර්‍මයෝ තවත් ධර්‍ම වලට පීඩා කරනවා - ධර්‍මයෝ තවත් ධර්‍ම වලට උපකාර කරනවා. ධර්‍මයෝම තවත් ධර්‍මවලට බලපෑම් කරනවා. ධර්‍මයෝම තවත් තවත් ධර්‍මවලින් බලපෑම් ලබා ගන්නවා. එනිසා මේ සිදුවීම් අතර වෙන කිසිම කෙනක් මේ ධර්‍මයන්ගේ පාලනය බාර ගත්ත කෙනෙක් නෑ. මේ ධර්‍මයන්ගේ පාලනය මේ ධර්‍මයන්ගේ අයිතිය ලබා ගත්ත කෙනෙක් නෑ. මේ ධර්‍මස්වභාවයන් මවපු හිතපු ගොතපු රාටවල් හදපු කෙනෙක් නෑ. ධර්‍මයන් නිකං ධර්‍ම හැටියට ඔහේ පහළවෙලා ධර්‍මයෝ හැටියට නැතිවෙලා යනවා හරියට වලාකුළු වගේ. වලාකුළු දිහා බැලුවම වලාකුළු නිකාම්ම ඇතිවෙනවා. ඒවගේම ඒකට හේතු තියෙනවා නිකාම්ම නැති වෙලා යනවා. ඒ සනට තියෙන වලාකුළු දිහා සමහර වෙලාවට බලාගෙන ඉන්න කොට අස්ව මුණු වගෙත් පේනවා. අලි මුණු වගෙත් පේනවා. මිනිස් ඔළු වගෙත් පේනවා. කෙනෙක් අහසේ පීනන්ට ඉන්නවා වගෙත් පේනවා. හැබැයි ඒ මොනවිදියට පල්ලෙහා ඉදල අපි ඔය උඩ බලාගෙන මොනවා හිතුවත් - මොන පින්තුර - මොන ආකල්ප - මොන සංකල්ප ඒවාට දුන්නත් - එතෙන්ට ගියාට පස්සෙ එතන තියෙන්නෙ වලාකුළු ටික විතරයි. ඒ වලාකුළු ටිකට එහා එතන දෙයක් නෑ. ඒවගේ අපි මේ මොනවා දැම්මත් මනුස්සයා - දෙවියා - පුද්ගලයා - තිරිසනා - මොනවා දැම්මත් ඔය වැඩ කරන ධර්‍ම ස්වභාව සමුහ වලට - චිත්ත ධර්‍මයන්ට - රූප ධර්‍මයන්ට - චෛතසික ධර්‍මයන්ට - මොන මොන ආකල්ප - මොන මොන පුද්ගල ඈදි සංකල්ප දුන්නත් ඒවා ඒවිදියට ඔහේ ධර්‍ම හැටියටම තිබිල නැතිවෙලා යනවා. ඒවගේම ධර්‍ම හැටියටම මතුවෙනවා - ධර්‍ම හැටියටම අනිත් ඒවාට බලපෑම් කරනවා. ධර්‍ම හැටියටම අනිත් ඒවගේ බලපෑම ලබනවා. ඊට වඩා කිසිම දෙයක් නෑ. ඔන්න ඔය ගාම්භීර ධර්‍මස්වභාවය අවබෝධය වශයෙන් සපර්ශකිරීමට මේ සාකච්ඡා කරන ධර්‍මය - මේ අහන ධර්‍මය සැමදෙනාටම කුසල වශයෙන් උපකාර වේවා කියල අපි මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. ඒවගේම ගැඹුරින් මේ ධර්‍මය හිතල මෙනෙහි කරලා ඒවාගේ ස්පර්ශය ලබාගෙන - අවබෝධය ලබාගෙන කිසිම තැනක මේ ධර්‍මය හොඳයි මේ ධර්‍මය හොඳයි කියල අල්ලන්නේ නැතුව දෘෂ්ටි වශයෙන් අල්ලන්නේ නැතුව ධර්‍මයෝ ධර්‍ම වශයෙන්ම අවබෝධ කරගෙන - ඒකාන්තයෙන්ම පරම ශාන්ත වූ ගාම්භිරවූ සූක්ෂම වූ ධර්‍මස්වභාවයක් තිබෙනවා - ඒ නිර්වාණ ධර්‍මය - ඒ නිර්වාණ ධර්‍මයෙන් නිවෙන්ට - ඒ නිර්වාණ ධර්‍මයෙන් සැනසෙන්ට සැම දෙනාටම මේ කුසලය හේතු

වාසනා වේවා! නිවන් අවබෝධ වේවා! කියල අපි මෛත්‍රීයෙන් ප්‍රර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

**සාධු! සාධු! සාධු!**

**සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං**
**දුල්ලභෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං**
**සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා**
**සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං**